# ආදි බුදුසමයේ හා ඉමැනුවෙල් කාන්ට්ගේ විශ්ව සංකල්ප විචාරය

කපිල අභයවංශ

තමා ජීවත් වන විශ්වයේ ස්වභාවය වටහා ගැනීමේ කුතුහලය මිනිසා තුළ නිරන්තරව ම පවතී. විශ්වය තුළ පවත්නා විවිධ විභින්න පදාර්ථ මනසට ගොදුරු කර ගත හැකි වුවද විශ්වය සමස්තයක් වශයෙන් ග්‍රහණය කර ගැනීමට මනස අපොහොසත් වෙයි. අනන්ත අපරිමාණ වූ විෂය පදාර්ථ සමුදායක් විශ්වය පුරා විසිරී ඇත. මේ එක් එක් විෂය පදාර්ථයක් අපේ ඉන්ද්‍රියඥානයෙන් හෝ ආනුභවික සම්පරීක්ෂණයන්ගෙන් හෝ විශ්ලේෂණය කොට දැනගත හැකි වුවත් එපමණින් මානසික කුතුහලය සන්සිඳීමක් නොවෙයි. මිනිසා විශ්වය ලෙස සැලකීමට පුරුදුව ඇත්තේ යථෝක්ත විභින්න විෂය පදාර්ථ නොව විෂය පදාර්ථ සමස්තයම නියෝජනය කරන පොදු සංකල්පයකි. එබඳු සංකල්පයක් ප්‍රත්‍යක්ෂණීය මූලධර්මයන්ගෙන් පරිබාහිරව පවතී. සංකල්පයේ සත්‍යතාව ප්‍රතිග්‍රහණය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හැකියාවක් නැත. ප්‍රත්‍යක්ෂණීය මූලධර්මයන්ට අනුකූලව පවතින්නේ අනුභවික විෂයපදාර්ථ පමණි. ආනුභවිකත්වය ඉක්මවූ විශ්වය වැනි සංකල්පයක් පාරානුභවික පදාර්ථයක් ලෙස දර්ශනය විෂයෙහි දී හැඳින්වෙයි.

විශ්වය නිර්මාණය වූයේ කුමන මූලද්‍රව්‍යයකින්ද? විශ්වය නිර්මාණ කළේ කවුරුන් විසින් ද? විශ්වයට මුලක් තිබේ ද? ආදී ප්‍රශ්න ආගමික හා දාර්ශනික ඉතිහාසයන්ගේ ආරම්භයෙහි සිට ම පැවති බව පෙනේ. විශ්වය නිර්මාණය කළ වඩුවා කවරෙක්දැයි ඍග්වේද සූක්තයකින් ප්‍රශ්න කෙරෙයි.[1] බටහිර දර්ශනයේ පාරානුභවික විද්‍යාව ආරම්භ වන්නේ භෞතික ලෝකයේ ආරම්භය හා එය නිර්මාණය වූ මූලද්‍රව්‍යය පිළිබඳ ක්‍රි. පූ. 6 වැනි සියවසට අයත් ග්‍රීක අයෝනියානු විශ්වවිභාගවාදීන්ගේ (Cosmologists) කල්පනික චින්තනයන්ගෙනි.[2] දර්ශන ඉතිහාසයෙහි ආරම්භයෙහි සිට දාර්ශනිකයන්ගේ සාකච්ඡාවට භාජනය වී ඇති විශ්වය යනු කාලයෙන් හා අවකාශයෙන් සීමා නිර්ණය කළ නොහැකි අනන්ත හා අසාර වූ පදාර්ථයකි. විෂයපදාර්ථ හඳුන්වාදීම සඳහා භාෂාවක පද ව්‍යවහාර වන බව අපි දනිමු. විෂයපදාර්ථ